සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

Grade 10 / 10 ශ්‍රේණිය / தரம் 10

භූගෝල විද්‍යාව I පත්‍රය / புவியியல் வினாத்தாள்-I / Geography Paper I

පැය එකයි / ஒரு மணித்தியாலம் / One Hour

උපදෙස්

- පළමු කොටසේ සියළුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැලපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන සම්පූර්ණ කරන්න.

01. පෘථිවිය මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් මිලියන .................................... කි.
(105, 510, 1510)

02. ජෛව ගෝලයේ පැවැත්මට ඉතාම වැදගත් ඕසෝන් ස්තරය පිහිටා ඇත්තේ .................................... ගෝලය තුළය.
(පරිවර්ති, අපරිවර්ති, තාප)

03. පෘතුවියේ මුළු භූමි ප්‍රමාණයෙන් .................................... % ගොඩබිමට අයත් වේ.
(71,29,97)

04. කර්කටක නිවර්තනයට සූර්යයා මුදුන් වන්නේ .................................... දාය.
(ජුනි 22, මාර්තු 21, සැප්තැම්බර් 23)

05. ලෝක විද්‍යුත් නිෂ්පාදන කර්මාන්තයේ කලාපීය ප්‍රමුඛයන් හා භාවිත ක්ෂේත්‍ර අනුව ...................................., යුරෝපය,උතුරු ඇමරිකාව ප්‍රමුඛ වේ.
(චීනය, ජපානය, ඉංදියාව)

06. ඉංග්‍රිසි ජාතික .................................... විසින් තේ වගාව 1839 වසරේදී හඳුන්වා දෙන ලදී.
(ජේම්ස් ටේ්‍රලර්, වෙස්ට් රිජ්වේ, කොල්බෲක් සාමි)

07. 1972 වසරේදී .................................... දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.
(සුළු අපනයන භෝග, තේ, රබර්)

08. රන්න, මිද්දෙනිය,තංගල්ල යන ප්‍රදේශ සම්බන්ධ කර .................................... පිහිටා තිබේ.
(පොල් ත්‍රිකෝණය, වෙරළ තිරයේ පොල් වගාව, සුළු පොල් ත්‍රිකෝණය)

09. පොළොව මතුපිටින් යපස් ලබා ගත හැකි ප්‍රදේශයක් ලෙස .................................... ලෝක ප්‍රසිද්ධ වී තිබේ.
(කියෝතෝ කලාපය, ෂන්ෂුවං ප්‍රදේශය, බර්මින් හැම් දිස්ත්‍රික්කය)

10. වී වගාව සඳහා .................................... $^0C$ උෂ්ණත්වයක් අවශ්‍ය වේ.
(27, 100, 50)

- ප්‍රශ්න අංක 11 හා 12 සඳහා සුදුසු පිළිතර තෝරා යටින් ඉරක් අඳින්න.

11. වායු ගෝලයේ එක් එක් ස්තර පිහිටි උස ප්‍රමාණයන් නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1) පරිවර්ති ගෝලය | A 0 - 20 Km |
| 2) අපරිවර්ති ගෝලය | B 80 - 120 Km |
| 3) මෙසො ගෝලය | C 20 - 50 Km |
| 4) තාප ගෝලය | D 50 - 80 Km |

(i) A,B,C,D (ii) D,C,A,B (iii) A,C,D,B (iv) D,A,C,B

12. ආසියාවේ වී වගා කරන ප්‍රදේශ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

| | | | |
|---|---|---|---|
| A) | ඉතාලියේ පෝ ගංගා නිම්නය | D) | මැඩගස්කරය |
| B) | අප්‍රිකාවේ නයිල් නිම්න ඩෙල්ටාව | E) | බංගලාදේශය |
| C) | පකිස්ථානය | F) | තායිලන්තය |

(i) C,D,E (ii) D,E,F (iii) A,B,D (iv) C,E,F


- **අංක 13 සිට 20 දක්වා එක් එක් ප්‍රකාශ කියවා බලා නිවැරදි නම් "නි" යන්න වටා ද වැරදි නම් "වැ" යන්න වටාද රවුමක් අඳින්න.**

13. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය වැඩි වශයෙන් ව්‍යාප්ත දිස්ත්‍රික්කයක් ලෙස හම්බන්තොට හඳුනා ගත හැකිය. (නි, වැ)
14. චීනය ලොව වැඩිම කපුපිළි නිශ්පාදනය කරනු ලබන රටකි. (නි, වැ)
15. අභ්‍යාවකාශයේ සිට පෘථිවිය දෙසට පතිත වන උල්කාෂ්ම බොහොමයක් අපරිවර්ති ගෝලයේදී විනාශ වේ. (නි, වැ)
16. ආසියා මහද්වීපික තටකය තුළ පිහිටි දූපතක් ලෙස බෝර්නියෝ සහ තස්මේනියා හඳුනාගත හැකිය. (නි, වැ)
17. නිවර්තන කලාප වලට මකර හා කර්කටක නිවර්තන අයත් වේ. (නි, වැ)
18. රිකිලි තේ ගස් වලට වඩා බීජ තේ ගස් ප්‍රචලිත වී ඇත. (නි, වැ)
19. කිරිපට්ටි පාලනයේදී ලොව සෑම රටකම පාහේ නව තාක්ෂණය භාවිත කෙරේ. (නි, වැ)
20. ශ්‍රී ලංකාවේ උසම කඳුවැටිය පිදුරුතලාගල කඳුවැටියයි. (නි, වැ)

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.**

21. ශ්‍රී ලංකාවේ වැඩිම මත්ස්‍ය අස්වැන්නක් හිමි වන්නේ .............................. ධීවර කලාපයෙනි.
22. ඉස්සන් බෝ කිරීම සඳහා .............................. සමාගම් උදව් උපකාර කරයි.
23. ශ්‍රී ලංකාවේ තවමත් වැඩිම සේවා නියුක්තියක් සහිත අංශය වන්නේ .............................. යයි.
24. අතීතයේ නැව් ප්‍රධාන වශයෙන් මගින් ප්‍රවාහනයට යොදා ගත්තද වර්තමානයේ .............................. ප්‍රවාහනයට වැඩි වශයෙන් යොදා ගනී.
25. දිගු කාලීන භාවිතය නිසා .............................., ක්ෂය වෙමින් පවතින සම්පතක් ලෙස හැඳින්වේ.

- **පහත සඳහන් සිතියම ඇසුරින් 26 සිට 28 දක්වා ප්‍රශ්නවලට අදාල පිළිතුර තෝරන්න.**



26. ඉහත ලංකා සිතියමේ K අක්ෂරයෙන් දක්වා ඇති කඳුවැටිය වන්නේ ........................................ කඳුවැටියයි.

27. සිතියමේ L අක්ෂරයෙන් දක්වා ඇති ඉතා සුප්‍රසිද්ධ ගංගාව වන්නේ ........................................ ගඟයි.

28. ශ්‍රී ලංකාවේ වැඩිම වී වගාවක් දක්නට ලැබෙන ........................................ දිස්ත්‍රික්කය M අක්ෂරයෙන් දක්වා ඇත.

- **අංක 29 සිට 40 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

29. වායු ගෝලයේ අඩුම උෂ්ණත්වයක් දක්නට ලැබෙන ස්තරය

| | | | |
|---|---|---|---|
| (i) | මෙසෝ ගෝලයයි. | (ii) | තාප ගෝලයයි. |
| (iii) | පරිවර්ති ගෝලයයි. | (iv) | අයන ගෝලයයි. |

30. ශ්‍රී ලංකාව පිහිටා ඇති භූ තැටිය වන්නේ

| | | | |
|---|---|---|---|
| (i) | යුරේෂියා | (ii) | ඉන්දු ඔස්ට්‍රේලියා |
| (iii) | උතුරු ඇමරිකා | (iv) | පැසිපික් |

31. කැනරි දූපත් අයත් වන්නේ කුමන මහාද්වීපයකටද?

| | | | |
|---|---|---|---|
| (i) | ආසියා මහාද්වීපය | (ii) | අප්‍රිකා මහාද්වීපය |
| (iii) | ඔස්ට්‍රේලියා මහාද්වීපය | (iv) | යුරෝපා මහාද්වීපය |

32. මරියානා අගාධයේ ගැඹුර නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

| | | | |
|---|---|---|---|
| (i) | 11035 m | (ii) | 10497 m |
| (iii) | 11053 m | (iv) | 10947 m |

33. ශ්‍රී ලංකාවේ මුල්ම රබර් ශාඛය සිටුවන ලද්දේ,

(i) ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

(ii) සීතාවක උද්භිද උද්‍යානය

(iii) හග්ගල උද්භිද උද්‍යානය

(iv) පේරාදෙණිය උද්භිද උද්‍යානය

34. මහද්වීප මායිමේ සිට සාගරය දෙසට පැතිර ගිය නොගැඹුරු මුහුදු තීරය

| | | | |
|---|---|---|---|
| (i) | මහාද්වීප තටකය | (ii) | වෙරළ තීරය |
| (iii) | මහාද්වීපික බෑවුම | (iv) | සියල් ස්ථරය |

35. ලොව විශාලතම විල ලෙස සලකනු ලබන්නේ,

| | | | |
|---|---|---|---|
| (i) | අයර් විල | (ii) | ටිටිකකා විල |
| (iii) | ලැඩෝගා විල | (iv) | සුපිරියර් විල |

36. පිරාඟ් නැමති සිව්පා සතා කුමන දේශගුණ කලාපයක ජීවත්වන සතෙක්ද?

| | | | |
|---|---|---|---|
| (i) | සෞම්‍ය කලාපයේ | (ii) | ශීත කලාපයේ |
| (iii) | නිවර්තන වර්ෂා වනාන්තර වල | (iv) | නිවර්තන තෘණභූමිවල |

37. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ලබා දෙන ප්‍රධාන අපනයන භෝගය වන්නේ

| | | | |
|---|---|---|---|
| (i) | රබර් | (ii) | පොල් |
| (iii) | තේ | (iv) | වී |

38. රාජ්‍යීය මුහුදු සීමාව නිවැරදිව දක්වා ඇත්තේ

| | | | |
|---|---|---|---|
| (i) | නාවික සැතපුම් 12 කි. | (ii) | නාවික සැතපුම් 24 කි. |
| (iii) | කිලෝ මීටර් 44 කි. | (iv) | කිලෝ මීටර් 340 කි. |

39. කැට්ලා මත්ස්‍ය වැඩි වශයෙන් ජීවත් වන්නේ

| | | | |
|---|---|---|---|
| (i) | කරදිය | (ii) | දෙදිය |
| (iii) | මිරිදිය | (iv) | කිවුල්දිය |

40. ඉතාලියේ පෝ ගංගා නිම්නයේ වැඩි වශයෙන් වගා කරනු ලබන බෝගයකි.

| | | | |
|---|---|---|---|
| (i) | තිරිඟු | (ii) | වී |
| (iii) | බාර්ලි | (iv) | සෝගම් |

ලකුණු 1× 40 = 40

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | භූගෝල විද්‍යාව II පත්‍රය<br>புவியியல் வினாத்தாள்-II<br>Geography Paper II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

උපදෙස්

- මෙම ප්‍රශ්න පත්‍රය I,II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය. I කොටස අනිවාර්ය වේ. එහි "අ" හා "ආ" කොටස් දෙකටම පිළිතුරු සැපයිය යුතුවේ.

---

I කොටස

1) (අ) නිවැරදි සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිත කර පහත 1 සිට 10 දක්වා දී ඇති දෑ ලෝක ආකෘති සිතියමක ලකුණු කරන්න.

(1) ඇටකාමා කාන්තාරය
(2) ඕස්ට්‍රේලියානු මහාද්වීපය
(3) අයිස්ලන්තය
(4) බෝල්ටික් මුහුද
(5) කැරිබියන් මුහුද
(6) යූරල් කඳු
(7) නයිල් ගඟ
(8) ඇන්ටාටික් වෘත්තය
(9) වැඩි විල
(10)ඇමසන් වනාන්තරය

(ආ)නිවැරදි සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිතා කර පහත 1 සිට 10 දක්වා දී ඇති දෑ ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.

(1) බෝඹුවල වී පර්යේෂණායතනය
(2) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
(3) තලවාකැලේ
(4) තංගල්ල
(5) කුරුණෑගල
(6) මහවැලි ගඟ
(7) සිංහරාජ වනාන්තරය
(8) යාපනය
(9) දෙවුන්දර තුඩුව
(10) මඩකලපුව

- දෙවන කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

(2) I ජෛව ගෝලයේ ක්‍රියාකාරීත්වය සඳහා බලපාන සාධක දෙක ලියන්න. (ල. 02)

II ජෛව ගෝලීය සීමාවන් 03 ලියා දක්වන්න. (ල. 03)

III ජෛව ගෝලය මිනිසාට වැදගත් වන ආකාරය කරුණු දෙකක් ඇසුරින් පහදන්න. (ල. 05)


(3) I ශ්‍රී ලංකාවේ වී වගාව ව්‍යාප්ත ප්‍රධාන පාරිසරික කලාප 02 ක් ලියන්න. (ල. 02)

II ශ්‍රී ලංකාවේ වී වගාවට අවශ්‍ය භෞතික සාධක 03 ක් ලියන්න. (ල. 03)

III ශ්‍රී ලංකාවේ තේ වගාවේ මෑත කාලීන ප්‍රවනතා 03 ක් ලියා 02 ක් විස්තර කරන්න. (ල. 05)

(4) I පෘථිවියේ ප්‍රධාන භෞතික ලක්ෂණ 02 මොනවාද? (ල. 02)

II පහත ලෝක සිතියමේ A,B,C වශයෙන් දක්වා ඇති ප්‍රධාන දේශගුණික කලාප 03 නම් කරන්න. (ල. 03)




III නිවර්තන දේශගුණය සහිත ප්‍රදේශයක විශේෂ ලක්ෂණ 05 ක් ලියා දක්වන්න. (ල. 05)


(5) I ලෝකයේ වී වගාව කරන ප්‍රධාන ප්‍රදේශ 02 නම් කරන්න. (ල. 02)

II තිරිඟු වගාවට අවශ්‍ය භෞතික ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

III තිරිඟු වගාවේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 03 ක් ලියා ඉන් දෙකක් පහදන්න.(ල. 05)

(6) I ශ්‍රී ලංකාවේ වගා කර ඇති සුළු අපනයන භෝග වර්ග 02 ක් නම් කරන්න. (ල. 02)

II පහත ශ්‍රී ලංකා සිතියමේ දක්වා ඇති ප්‍රදේශ අතරින් සුළු අපනයන භෝග වගා කරන ප්‍රදේශ තුනක් තෝරා ලියන්න. (ල. 03)




III ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ගැටළු 03 ක් ලියා ඉන් 02 ක් පැහැදිලි කරන්න. (ල. 05)


(7) I ලෝකයේ යකඩ හා වානේ නිශ්පාදනය කරන රටවල් දෙකක් නම් කරන්න. (ල. 02)

II යකඩ හා වානේ කර්මාන්තය ස්ථානගත වීමට බලපාන සාධක 03 ක් ලියා දක්වන්න. (ල. 03)

III යකඩ හා වානේ කර්මාන්තයේ ලක්ෂණ හා ප්‍රවණතා පහක් ලියන්න. (ල. 05)




The National e-learning Portal for The General Education



The National e-learning Portal for The General Education

__මුස්ලිම් පාසල් සඳහා උපදෙස්__

- දෙවන කොටසේ ප්‍රශ්න තෝරා ගැනීමේදී ප්‍රශ්න අංක 08 හා 09 ප්‍රශ්න ද පිළිතුරු ලිවීමට තෝරා ගන්න.
- පිළිතුරු සැපයීමේදී පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න 08 න් 04 කට පිළිතුරු සපයන්න.

(8) I පෘථිවි කබොල ප්‍රධාන කොටස් 02 කින් සමන්විතය. ඒවා නම් කරන්න. (ල. 02)

II මිනිසා ශිලාගෝලය ප්‍රයෝජනයට ගැනීමේදී ඇතිවන බලපෑම් 03 ක් ලියන්න. (ල. 03)

III වායුගෝලය දූෂණයට හේතු වන මිනිස් ක්‍රියාකාරකම් 03 ක් ලියා එකක් විස්තර කරන්න. (ල. 05)

(9) I පෘථිවියේ භූ රූප ලක්ෂණ ඇසුරින් පරිමාණය අනුව විශාලම භූ රූප දෙකකි. ඒවා නම් කරන්න. (ල. 02)

II ලෝකයේ ගංගා ආරම්භ වන්නේ විවිධ ස්වරූපවලිනි. පහත සඳහන් ආකාර වලින් ආරම්භ වන ගංගා 03 ක් පිළිවෙලින් ලියන්න.

- උල්පතකින්
- විලකින්
- ග්ලැසියර් දිය වූ ජලයෙන් (ල. 03)

III ශ්‍රී ලංකාව අයත් දෙශගුණ කලාපය නම් කර එහි දැකිය හැකි ලක්ෂණ 04 ක් ලියන්න. (ල. 05)

The National e-learning Portal for The General Education